# තනතුරු - ඇබෑර්තු

## <u>වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම</u>

වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමට, වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

*01. සුදුසුකම්:*

I. පශු වෛද්‍ය උපාධියක් සහිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර 03 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. 2025.06.20 දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**සටහන:** අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට මෙම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර ඉහත සඳහන් සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහ ජාතික හැඳුනුම්පතේ තමා විසින් සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.

*02. තෝරා ගැනීමේ ක්‍රමය:*

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

*03. අයදුම්පත් ඉදිරිපත් කිරීම:*

සියලුම අයදුම්පත් (ආදර්ශ අයදුම්පත්‍රය www.psc.nw.gov.lk යන වෙබ් අඩවියෙන් භාගත කරගත හැකිය) විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2025.06.20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය.) **"ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, මාලිගාව, කුරුණෑගල"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් භාර ගනු නොලැබේ.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතු වේ.

මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතු වේ.

මෙයට,

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආණ්ඩුකාරවර ලේකම්,<br>
ආණ්ඩුකාරවර කාර්යාලය,<br>
වයඹ පළාත.

2025.06.09